# "දඟයා", "පුංචි අන්දරේ" සහ "දේව වස්ත්‍රය" පුණ්‍යවන්ත වූ කාර්යයක



ශ්‍රී ලංකා රංග නිකේතනය ඉදිරිපත් කරන කුසුම්සිරි සහ යශෝධරා නාට්‍ය නිර්මාණ ත්‍රිත්වයක් වූ-දඟයා",-පුංචි අන්දරේ" සහ -දේව වස්ත්‍රය" නාට්‍ය ත්‍රිත්වය මාර්තු මස තුළ දී දර්ශන වාර කිහිපයක්ම රඟ දැක්වීමට නියමිතව ඇත.

ඉන් පළමු දර්ශන වාරය මාර්තු මස 5 වන සෙනසුරාදා සවස 6.00ට ප්ලේන්ටි රේන්ජස් ආර්ට්ස් ඇන්ඩ් කන්වෙන්ෂන් සෙන්ටර් හිදී රඟ දැක්වීමට නියමිතව ඇත. ඒ වූකලී කැම්බෆීල් සමාධි බෞද්ධ විහාරස්ථාන ගොඩනැගිලි අරමුදලට ආධාර පිණිසය.

අනතුරුව මාර්තු මස 19 සහ 20 යන දෙදින තුළදී ක්රැන්බර්න් කමියුනිටි රංග ශාලාවේ දී ඉහත කී නාට්‍ය ත්‍රිත්වයම ඇතුලත් දර්ශන වාර 4කින් සමන්විත නාට්‍ය උළෙලක් පැවැත්වීමට නියමිතව ඇත. ඒ බෙරික් ශාක්‍යමුණි සම්බුද්ධ විහාරයට ආධාර පිණිසය.

### "දඟයා"

2008 වසරේ දී මුල් වරට රඟදැක් වූ දඟයා නාට්‍යය මෙල්බර්න් ලාංකික ජන සමාජයේ ළමා වැඩිහිටි බොහෝමයකගේ ආදරයට ලක් වුනු නාට්‍යයක් විය. එම හේතුව නිසාවෙන්ම මෙල්බර්න් නගරයේ දී පමණක් 2008 සහ 2009 දෙවසර තුළදී දර්ශන වාර 6 ක් -දඟයා" රඟ දැක්වින. පසුව 2010 මාර්තු 19වන දා -දඟයා" නිර්මාණයට විශේෂිත වූ අවස්ථාවක් උදාවිය. එනම් ලින්බ්රූක් ප්‍රාථමික පාසලේ ජාත්‍යන්තර එකමුතු දින උත්සවයේ දී සිංහල භාෂාව වචනයකුදු නොදත් ළමා ප්‍රේක්ෂකාගාරයක් ඉදිරිපිට දී -දඟයා" රඟ දැක්වීමය. ලාංකික නොවූ ළමා ප්‍රේක්ෂකාගාරයක් -දඟයා" රසවිඳි අයුරු නාට්‍ය කණ්ඩායමටත් අපූරු අත්දැකීමක් බවට පත්විය. එදා ඒ අත්දැකීමේ ඵලයක් ලෙසින් මෙවර -දඟයා" නව නිෂ්පාදනය සිදුව ඇත. නව නිෂ්පාදනයේ විශේෂත්වය නම් නාට්‍යය ඉංග්‍රීසි සහ සිංහල යන භාෂා ද්විත්වයේම මිශ්‍රණයකින් රංග ගත වීමයි. ලාංකික අනන්‍යතාවයට හානිකර නොවී භාෂා ද්විත්වයේම ඇසුරෙන් සජීවී වන -දඟයා" නව නිෂ්පාදනය එක්තරා අයුරකින් අත්හදා බැලීමක් ද වනු ඇත.
"අපි කීකරු හා පැටව්.. අපි කීකරු මී පැටව්..
අම්මාට තාත්තාට කීකරු වෙන්නට - ආච්චීට සීයාට කීකරු වෙන්නට ඕනෑ හේතුව දැන් අපි දන්නෙමු.."

එදා ළමා ප්‍රේක්ෂක බොහෝමයකගේ සිත් ගත් එම ගීත පෙළ, දඟකාර හා පැටවුන්ගේ සහ මී පැටවුන්ගේ කතාන්දරය නැවතත් ඔබේ දරු දැරියනට දැක බලා ගැනීමේ අවස්ථාව උදා වී ඇත.

### "පුංචි අන්දරේ"

අන්දරේ වූ කලී ලංකික ජන සාහිත්‍යයේ ඉතා ප්‍රචලිත චරිතයක්. අන්දරේගේ ළමා කාලය හා බැඳි කතා කිහිපයක් සහ ළමා අන්දරේට ගැලපෙන අයුරින් සකසාගත් කතා එකතුවකින් නිර්මිත -පුංචි අන්දරේ" මුල් වරට රඟදැක්වුනේ 2010 සැප්තැම්ර් 11 වන දිනදීය. අනතුරුව දෙසැම්බර් 11 වන දින දී ඇඩිලේඩ් නගරයේ දී රඟ දැක්වුනු -පුංචි අන්දරේ" නගර ද්විත්වයේම ප්‍රේක්ෂක බොහෝමයකගේ හිත් බැඳගත් සුන්දර නාට්‍ය නිර්මාණයක් බවට පත් විය. ගුරු ගෙදරින් පැන එන අන්දරේට කවි සිත් පහළවන සැටි.. නාන තොටේදි යෙහෙළියන්ට විහිළු තහළු කරනා සැටි.. කරණවෑමියාට විසිළු කිරීමට ගොස් පාඩම් ඉගෙන ගන්නා සැටි.. හොරගස් නැගීමට ගොස් අසුවන සැටි.. මගුල් ගෙදර ගොස් ගොනා වගේ ඉන්නා සැටි..අපූර්ව ලෙසින් නාට්‍යයෙහි පෙළගැස්වීමට උත්සහ දරා ඇත්තෙමු. ඒ ළමා මනසට උපදෙස් රැසක්ද ලබාදෙන අයුරිනි.

යාළුවො අතරෙහි හපනෙකු වෙන්නට
සිතා වැරදි දේ නොම කරලන්නට
පුංචි ඔයාලට ඒත්තු යන්නට
අපි සිතුවා එය රඟා මවන්නට

ලාංකික දරු දැරියනට අපේ ජන සාහිත්‍යයේ විශේෂිත වූ කතා පෙළක් සහ චරිතයක් පිළිබඳව දැන ඉගෙනීමට -පුංචි අන්දරේ"නාට්‍ය නිර්මාණය සමත්වනු නොඅනුමානය.

අපි වගේම පුංචි කෙනෙක් වීද අන්දරේ
අපිට වඩා වෙනස් උනේ කෝම අන්දරේ
රජ සිටුවරු ඇසුරු කලත් පසුව අන්දරේ
ළමා කාලේ අපි හැමෝම පුංචි අන්දරේ

කවියෙන් ගීතයෙන් නැටුමෙන් පෝෂණය වෙමින් සෞන්දර්යාත්මක නාට්‍ය නිර්මාණයක් ලෙසින් එළි දකින පුංචි අන්දරේ අපේ දූ පුතුනට ලාංකික ජන සංගීතයෙහි නර්ථනයෙහි සුන්දරත්වය අපූර්වත්වය පෙන්වාලීමට සමත් නිර්මාණයකි.

### "දේව වස්ත්‍රය"

2010 සැප්තැම්බර් 11 දින මුල් වරට රඟ දැක්වූ -දේව වස්ත්‍රය" වූ කලී මූලිකව වැඩිහිටි ප්‍රේක්ෂකාගාරයක් උදෙසා නිර්මිත දේශපාලන ප්‍රහසනයකි. විවිධ වූ සංස්කෘතීන් අතුරේ විවිධ නාමයන්ගෙන් හැඳින්වෙන, -සීතාම්බරපට" ලෙසින් ලාංකික අපට හුරු කතාන්දරය -දේව වස්ත්‍රය"ට පාදක වී ඇත. ලොව බොහෝමයක් රාජ්‍යයන්හි පාලක පන්තියට පොදු සර්ව කාලීන කාරනා රැසක් හාස්‍යයට ලක්කෙරෙන දේව වස්ත්‍රය මංගල දර්ශනයෙන් අනතුරුව විවිධ වූ ප්‍රතිචාරයන්ට ලක් වූ නාට්‍යයකි.

### නාට්‍ය කණ්ඩායම

කුසුම්සිරි සහ යශෝධරා රංග කාර්යයක් ලෙසින් එළි දකින "පුංචි අන්දරේ" සහ "දේව වස්ත්‍රය" නාට්‍යයට රංගනයෙන් දායක වන ළමා කැළ මෙසේය.
තිළිණි රණසිංහ, වසුන්දරා ඕපනායක, හසිනි ඉලංගරත්න, නෙවින් වල්පොල, රන්දු වල්පොල, නිමාෂි පැල්පොල, මංජිත විජේසිංහ, නෙත්මා මල්ලව, නුවන් රණසිංහ, කසුන් මුණසිංහ, මනීෂා ගමගේ, තිලාන් ගමගේ, කසුනි පාදුක්කගේ, දිමිති කස්තුරිරත්න, කාවින්ද මුණසිංහ, සම්මානි සේනාරත්න, ජනනි මුණසිංහ, ජනනි සේනාරත්න, මධුර බණ්ඩාර, ජනනි කුරුකුලරත්න, නිලූෂි ජයරත්න, විනුකි මල්ලව, අමානදි දිසානායක, දිලිත විජේසිංහ, තරුෂි ෆර්නෑන්ඩු, තිෂාරා කත්රිආරච්චිගේ, ඉසිනි බුත්ගමුව, තරුෂ පීරිස්, අයන්ගි කුමාරනායක, ෂෙහාන් ඩි මෙල්, අර්චනා අත්ලගේ, නිලිනිකා පස්හැන්න, දිහිනි ලියනආරච්චි,
රංගනයෙන් දායක වන වැඩිහිටි කැළ මෙසේය.
දයානන්ද ලියනආරච්චි, සුසන්ත ලියනආරච්චි, චින්තක සමරකෝන්, වසන්ත මුතුමාල, ප්‍රසාද් විජයබන්ඳු, ප්‍රසන්න කුරුකුලරත්න, ධර්මසිරි ජයසිංහ, තුසිත දසනායක, රත්නා ගුරුසිංහ, කණිෂ්ක රාජපක්ෂ

නාට්‍යද්වයයේ වේදිකා පරිපාලනයෙන් තුසිත දසනායක, රොෂාන් ද සිල්වා සහ නිශ්ශංක මල්ලව ද රංග ආලෝකයෙන් සුපින් බණ්ඩාර ද දායක වනු ඇත. පෙළ මතක් කරලීමෙන් ලිලංගා වල්පොල සහ කසුනි ජයවර්ධන දායක වනුයේ සමස්ථ නාට්‍ය කැළටම විශේෂිත සහයෝගයක් ලබාදෙමිනි.
පුංචි අන්දරේ හි තනු නිර්මාණය යශෝධරා සරච්චන්ද්‍ර විසින් ද දේව වස්ත්‍රය හි තනු නිර්මාණය සහ නාට්‍ය ද්විත්වයේම සංගීතය මෙහෙයවීම භාණුක මනෝරත්න විසින් ද සිදුකෙරෙනු ඇත.

"දඟයා",-පුංචි අන්දරේ" සහ -දේව වස්ත්‍රය" කුසුම්සිරි ලියනආරච්චිගේ රචනයන් ත්‍රිත්වයකි.

වාද්‍ය වෘන්දයෙන් අත්වැල් ගායනයෙන් රංග භාණ්ඩ නිර්මාණයෙන් රංග වස්ත්‍ර සැකසීමෙන් ආදී නොයේක් අංශයන්ගෙන් තවත් නම් නොකී විශාල පිරිසක් දායක වනු ඇත. තම කාලය ශ්‍රමය කැප කොට කිසිඳු ආර්ථික ප්‍රතිලාබයකින් තොරව මෙම නාට්‍ය ත්‍රිත්වය සජීවී කරලීමට දායක වෙමින් කැම්බෆීල් සහ බෙරික් භාරස්ථානද්විත්වයට ආධාර පිණිස කෙරෙන්නාවූ මෙම සත්කාර්යයට දායක වන මෙකී නාට්‍ය කැලට මෙය සැබවින්ම පුණ්‍යවන්ත කටයුත්තක්ම වනු ඇත. එම පුණ්‍යවන්තකාර්යයට දායක වනවා සේම දුර්ලබ වූත් සුන්දර වූත් නාට්‍ය අත්දැකීමක් විඳගැන්මට ප්‍රේක්ෂක ඔබට ඇරයුම.





# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## බුදුන් දැක නිවන් දැකපන් මගේ ලේලි කෙල්ල

මද්දහනේ ගිනිකාස්ටකේ පිච්චිලා ගහ කොලත් කේඩෑරි වෙලා. මහ පොලොව පුපුරන්ඩ වගේ රත්වෙලා. හැන්දෑවෙ හීන් හුළඟ හමන්ඩ පටන් ගත්තෙ ඒ ඔක්කොම නිවා දාන්න වගේ. දවසේ වැඩ කටයුතු අවසන් කර ගෙපිලට ගොඩ වූ මට කොයින් මාමා කතා කළේ මෙහෙම.

"ඉරගල වැටෙන්ඩ කලියෙන් බෝත් වරෙන් දිය සනහා ගන්ට.."

මාත් බොහොම උවමනාවෙන් කොයින් මාමා පසුපස වැටුණා වැවට යන්ට. අපි වැව්කණ්ඩියට ගොඩ වෙන කොට ඉර ඈත ආකහේ තැඹිලි පාටට දිලිහෙමින් තිබුණා. දියට බහින්ට කලියෙන් මා දුටු දසුන මගේ හිතේ ඇති කළේ සතුටක්. තරුණියක් බොහෝම උවමනාවෙන් අවුරුදු අසූවක් පමණ වයසැති මවක් දිය නාවා පිරිසිදු කරනවා. බොහොම භක්තියකින්. ආදරයකින්.

දිය නෑවූ මාතාව ගසක් අසළ හිඳුවා තරුණිය නැවත දියට බැස්සාත්ව මම හිමිහිට ඒ මෑණියන් ළඟට ගියා. ඇගේ තොරතුරු දැනගන්ට මගේ හිතේ තිබුණෙ පුදුම කුතුහලයක්.

තරමක් කන් ඇසීම දුර්වල වුණාත් ඇය මා ඇසූ සියලු දේට පිළිතුරු දුන්නා. ඒ තරුණිය ඇගේ ලේලියයි. ලේලියගේ කරුණාව දයාව ලබන මේ මව ඇගේ කතාව මට කවියකින් කිව්වෙ මෙහෙමයි.

*වැදුම් ලන්නෙ එල්ලී ගෙන වැදුවා දරු ගොල්ල*
*වෙහෙස වෙලා හැදුවත් උන් වාගේ රජ ගොල්ල*
*මට බැරි කල පිහිට උණේ පිටින් ගෙනා කෙල්ල*
*බුදුන් දැක නිවන් දැකපන් මගේ ලේලි කෙල්ල*

බෝගල







ජගත් ජේ එදිරිසිංහ ගේ
"ඉස්කෝලෙ කාලේ" යොවුන් නවකතාව
"තාරකා විජිතය" නවකතාව
"රාජාලි පියාපත" කාව්‍ය සංග්‍රහය
නව පිටපත් ලැබී ඇත
පිටපතක් ඩොලර් 10 (තැපැල් ගාස්තු සමග)
විසමන්න
Sooriya Marketing Services
1B/132 Alexander Av Thomastown
VIC 3074 Australia
Tel – 613 9465 8257/ (61) 0433 438 535